# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2016 ඔක්තෝබර් මස 04 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි
### බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.36 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**●පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්. කුහවරදන්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහේෂ් අල්මේදා
මංජුල ප්‍රසන්න සම්පත්
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
රජිත හපුආරච්චිගේ
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොයිස් විජිත
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සරත් පතිරණ
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
සේනක දමයන්ත ද සිල්වා
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
උපාලි ගුණරත්න
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
කාමල් කුරුප්පු
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
නිරෝෂන් පාදුක්ක
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
යූ.එල්.එන්.පී. උඩවෙල
රන්ධීර් රොද්‍රිගෝ
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
සලෝචන ගමගේ

## 01. ආණ්ඩුකාරවරයාගෙන් ලැබෙන සංදේශ :

*"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ 3 අනු ව්‍යවස්ථාවට අනුව, මෙම පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කරනු පිණිස ශ්‍රී ලංකා තිරසාර සංවර්ධනය පිළිබඳ පනත් කෙටුම්පත අතිගරු ජනාධිපතිතුමන් විසින් ගරු ආණ්ඩුකාරතුමා වෙත එවා ඇති බවත්,*

*එම පනත් කෙටුම්පත බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කර පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශනයක්, අතිගරු ජනාධිපතිතුමන් වෙත වාර්තා කිරීමට හැකිවන පරිදි 2016.09.29 දින සිට දින 12 ක් ඇතුළත බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත එවන මෙන් ගරු ආණ්ඩුකාරතුමා විසින් දැනුම් දී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී."*[1]

## 02. සභාපතිවරයාගේ නිවේදන :

*i*

***"****ජනාධිපති ලේකම්ගේ අංක සී.එස්.ඒ/1/08 ඩබ්ලිව්.පී./01 හා 2016.09.28 දිනැති ලිපියට අනුව 2016.09.29 දින බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් ධූරයෙහි එම්.ඒ.බී. දයා සෙනරත් මහතා රාජකාරී කටයුතු භාරගත් බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.****"***[2]

## 03. ලිපි ලේඛන පිළිගැන්වීම :

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් *"ශ්‍රී ලංකා තිරසාර සංවර්ධනය පිළිබඳ පනත් කෙටුම්පත"* පිළිගන්වන ලදී.

## 04. කාරක සභා වාර්තා :

ඉසුර දේවප්‍රිය - ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තා ඇතුළත් කාණ්ඩ අංක 01 හා කාණ්ඩ අංක 02 පිළිගන්වන ලදි.

ගරු සභාපතිතුමා විසින් 2016.09.21 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව පිළිගන්වන ලදී.

## 05. නොපැමිණ සිටීමේ අවසරය :

*"සමන්මලී සකලසූරිය ගරු මන්ත්‍රීතුමියට මාස තුනක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි"* ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.

***පළාත් සභාව පූ.භා. 10.33 ට තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.30 ට යළිත් රැස් විය.***

## 06. බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය : පළමු වර කියැවීම

රංජිත් සෝමවංශ - ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා විසින්, *"2016 අංක ... දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය"* සභාවට පිළිගන්වන ලදී.

සභා ලේකම් [**හේමන්ත සමරකෝන් මහතා**] විසින් පහත සඳහන් ප්‍රඥප්තියේ පූර්විකාව කියවන ලදී.

*"බස්නාහිර පළාතේ පළාත් සභාවට පැවරී ඇති විෂයයන්ට අදාළ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා වූ තොරතුරු හා සන්නිවේදන කාර්යයන් විධිමත්ව, කාර්යක්ෂමව හා ඵලදායි ලෙස යොදා ගැනීම සඳහා ද පද්ධති හා ක්‍රම විශ්ලේෂණය හා වර්ධනයත්, පරිගණක තාක්ෂණය හා ඒ ආශ්‍රිත කටයුතු විධිමත් හා පුළුල්*

[1] 2016.10.04 වන දින නිල (හැන්සාඩ්) වාර්තාව බලන්න.
[2] - එම-

*කිරීම සඳහා ද තොරතුරු තාක්ෂණ සංවර්ධනයේ ප්‍රතිලාභ ජනතාවට ලබා දීම සඳහා ද ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද, 2000 අංක 06 දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා වූ ද ප්‍රඥප්තියකි."*

*අනතුරුව ප්‍රඥප්ති කෙටුම්පත, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු විය.*

## 07. රීති අංක 107 යටතේ යෝජනාව :

***මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර තිබූ රීති අංක 107 යටතේ වූ යෝජනාවට සභාවේ විරෝධය පළ වූයෙන්, ගරු සභාපතිතුමා විසින් [ අ.භා.12.10 ට ] සභාවේ එකඟතාවය විමසන ලදී.***

***ඒ අනුව, පළාත් සභාව 61(3) රීතිය යටතේ පක්ෂව 38 යි, විරුද්ධව 30 යි, වැළැකුණු 00 යි ලෙස බෙදුණේය.***

පසුව මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදන වලට අනුකූලව හා ඊට ආනුෂංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතින් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

## 08. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : උතුරු පළාත් ප්‍රධාන අමාත්‍ය සී.වී. විග්නේෂ්වරන් මැතිතුමාගේ ජාතිවාදී ප්‍රකාශ හෙළා දැකීම

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් සංශෝධිතාකාරයෙන් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන කරන ලදී.

*"උතුරු පළාතේ ගරු ප්‍රධාන අමාත්‍ය සී.වී. විග්නේෂ්වරන් මැතිතුමා විසින් පසු ගියදා කරන ලද ජාතිවාදී ප්‍රකාශයන් දැඩි පිළිකුලෙන් යුක්තව හෙළා දැකිය යුතු යැයි මෙම ගරු බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කර සිටී."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***අ.භා. 12.19 ට, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා] මූලාසනාරූඪ විය.***

***අනතුරුව, සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 09. කල් තැබීම :

ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 02.35 ට, 2016 ඔක්තෝබර් මස 18 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.10.04
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
කුමා/04